කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E3054 - අන්තර්ජාතික ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. ජාත්‍යන්තර වෙළඳාමෙහි එන නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ. හෙක්ෂර්-ඔහිලින් න්‍යාය සාපේක්ෂ වාසිය තවදුරටත් ඉහළ තලයකට පත් කිරීමට උත්සාහ කරයි. මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 05)

ඇ. පහත වගුවෙන් දැක්වෙනුයේ රටවල් 2 ක සාධක උරුමයයි.

| සාධක | A රට | B රට |
|---|---|---|
| ශ්‍රමය (ශ්‍රම පැය) | 40 | 10 |
| ප්‍රාග්ධනය (යන්ත්‍ර පැය) | 20 | 8 |

i. ශ්‍රමය බහුල රට කුමක්ද ?

(ලකුණු 02)

ii. ප්‍රාග්ධනය බහුල රට කුමක්ද ?

(ලකුණු 02)

iii. A රටින් B රටටත්, B රටින් A රටටත් හුවමාරු වන භාණ්ඩ වල ස්වභාවය ( ශ්‍රම සූක්ෂම භාණ්ඩ / ප්‍රාග්ධන සූක්ෂම භාණ්ඩ) කුමක්ද ?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

02. ශ්‍රී ලංකාව හා බංගලාදේශය යන රටවල් 2 කම තේ හා සහල් නිෂ්පාදනය කරයි. පහත වගුවෙන් එක් එක් රටෙහි ශ්‍රම පැයක් සඳහා වූ නිමවුම පෙන්නුම් කරයි.

| රට | තේ (kg) | සහල් (kg) |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 10 | 30 |
| බංගලාදේශය | 8 | 16 |

එක් එක් රට සඳහා ශ්‍රම පැය 100 බැගින් ඇත.

අ. ශ්‍රම පැය වලින් 40 % ක් තේ කර්මාන්තය සඳහා ද ඉතිරිය සහල් කර්මාන්තය සඳහාද භාවිතා කරයි නම් ශ්‍රී ලංකාවේ, බංගලාදේශයේ සහ ලෝකයේ නිෂ්පාදනය ගණනය කරන්න

(ලකුණු 06)

ආ. තේ හා සහල් සඳහා නිරපේක්ෂ වාසිය ඇත්තේ කුමන් රටවල් වලටද ?

(ලකුණු 03)

ඇ. තේ හා සහල් සඳහා සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටවල් වලටද ? වෙළඳාමක් සිදුවිය හැක්කේ කෙලෙසකටද ?

(ලකුණු 05)

ඉ. සාපේක්ෂ වාසිය අනුව රටවල් එක් භාණ්ඩයක් සඳහා පමණක් විශේෂීකරණය වුවහොත් ලෝක නිෂ්පාදනය හා අන්තර්ජාතික වෙළඳාම තුලින් ලැබෙන වාසිය ගණනය කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

03. අ. චල (පාවෙන ) විනිමය අනුපාත පද්ධතියෙන් ස්ථාවර විනිමය අනුපාත පද්ධතිය වෙන් කොට හඳුනා ගන්න.

(ලකුණු 04)

ආ. විදේශ විනිමය අනුපාතය ප්‍රත්‍යාගණනය (Revaluation) හා විදේශ විනිමය අනුපාතය ඉහලයාම (Appreciation) අතර වෙනස කුමක්ද ?

(ලකුණු 04)

ඇ. පහත තොරතුරු ඇසුරින් විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය හෝ අධි ප්‍රමාණය වීම ගණනය කරන්න.

2012 ජනවාරි 01 : ඩොලර් 1 = රු. 110

2012 දෙසැම්බර් 31 : ඩොලර් 1 = රු. 130

(ලකුණු 04)

ඉ. විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාක කවරේද ?

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. ගෙවුම් ශේෂ ලේඛනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. ගෙවුම් ශේෂ ලේඛනයේ කුමන ගිණුම් වල පහත ගණුදෙනු සටහන් කරයි ද ?

i. තේ අපනයන

ii. විදේශ නැවක් අළුත්වැඩියා කිරීම

iii. විදේශ ණය මුදල් වාරික ගෙවීම

iv. විදේශීය රටවල සේවය කරන ශ්‍රී ලාංකික ගෘහසේවිකාවන් විසින් එවන මුදල්

(ලකුණු 04)

ඇ. ගෙවුම් ශේෂ හිඟය යන්නෙන් ඔබ කුමක් අදහස් කරයිද ?

(ලකුණු 06)

ඉ. පහත සඳහන් ආර්ථික සංකලන ක්‍රමවේද වලින් ඕනෑම 2 ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

i. ආර්ථික සංගම්

ii. නිදහස් වෙළඳ කලාප

iii. වරණ වෙළඳ ගිවිසුම්

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

05. අ. නිදහස් වෙළඳාම යනු කුමක්ද ? නිදහස් වෙළඳාමට පවතින බාධක ලයිස්තු ගත කරන්න.

(ලකුණු 06)

ආ. ආරක්ෂණවාදය යන්නෙන් කුමක් අදහස් කෙරේද ?

(ලකුණු 06)

ඇ. ප්‍රපාතනය සිදුවන අවස්ථාවකදී වෙළඳ ආරක්ෂණය සාධාරණ විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඉ. තීරුබදු හා සලාක අතර වෙනස දක්වන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

06. පහත දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

අ. ලෝක ආර්ථික අවපාතය

ආ. ගෝලීයකරණය

ඇ. ඉදිරි විනිමය අනුපාතය

ඉ. අන්තර්ජාතික වෙළඳාමේ වාසි (ලකුණු 05 බැගින් )

(මුළු ලකුණු 20)